# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන)

**කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් නියම කරනු ලැබ ඇති කාලසීමාවක් තුළ ඉටු කිරීමට නීතිය මඟින් නියම කරන ලද ඇතැම් ක්‍රියාවන් ඉටු කිරීමට පුද්ගලයන්හට නොහැකි වූ අවස්ථාවන් සම්බන්ධයෙන් ද; කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් යම් අධිකරණයකට එහි කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී විකල්ප අධිකරණයක් නියම කිරීම සඳහා ද; 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) පාලනය කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කරගෙන යාම සඳහා ද; කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට නොහැකි වූ ඇතැම් ගිවිසුම්වල පාර්ශ්වයන් සම්බන්ධයෙන් සහනයක් ලබාදීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමා විසින් 2021 ජූනි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 මැයි මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[51 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 28.00 | තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන)

එල්.ඩී—ඕ. 19/2020

**කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් නියම කරනු ලැබ ඇති කාලසීමාවක් තුළ ඉටු කිරීමට නීතිය මඟින් නියම කරන ලද ඇතැම් ක්‍රියාවන් ඉටු කිරීමට පුද්ගලයන්හට නොහැකි වූ අවස්ථාවන් සම්බන්ධයෙන් ද; කොවිඩ්-19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් යම් අධිකරණයකට එහි කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී විකල්ප අධිකරණයක් නියම කිරීම සඳහා ද; 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) පාලනය කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කරගෙන යාම සඳහා ද; කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට නොහැකි වූ ඇතැම් ගිවිසුම්වල පාර්ශ්වයන් සම්බන්ධයෙන් සහනයක් ලබාදීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**ලුහුඬු නාමය, පනත ක්‍රියාත්මක වන කාලසීමාව සහ එය දීර්ඝ කිරීම**

1. (1) මේ පනත 2021 අංක    දරන 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. මේ පනතේ විධිවිධාන 2020 මාර්තු මස 1 වන දිනෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව ඉකුත්වීමට එක් මාසයකට පෙර ඕනෑම අවස්ථාවක දී, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, පනත ක්‍රියාත්මක වීම වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි යː

එසේ වුව ද, යම් දීර්ඝ කිරීමක සමස්ත කාලසීමාව, එම දීර්ඝ කිරීමේ දින සිට අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.

## I වන කොටස

### නියම කරනු ලැබ ඇති කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වීම සඳහා වන සහනය

නියම කරනු ලැබ ඇති කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වීම සඳහා වන සහනය

**2.** (1) යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන්, යම් තැනැත්තකු-

(අ) එම කාර්යය සඳහා නීතිය මඟින් නියම කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නීති කෘත්‍යයක් පැවරීමෙන් හෝ ගොනු කිරීමෙන්; හෝ

(ආ) නියම කරනු ලැබ ඇති කාලසීමාවක් ඇතුළත කිරීමට හෝ ඉටු කිරීමට නීතිය මඟින් නියම කරන ලද යම් ක්‍රියාවක් ඉටු කිරීමෙන්,

වළක්වනු ලැබූ බවට යම් අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවනු ලැබ ඇති වෙනත් යම් අධිකාරියක් විසින් සෑහීමට පත් වනු ලබන අවස්ථාවක දී, එම කාර්යය සඳහා නීතිය මඟින් නියම කරන ලද කාලසීමාව ඉකුත්වීම නොතකා, (අ) හෝ (ආ) ඡේදවල සඳහන් කරන ලද නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක්, වෙනත් නීති කෘත්‍යයක් හෝ ක්‍රියාවක් සඳහා අවසර ලබාදීමට, පිළිගැනීමට හෝ භාරගැනීමට එම අධිකරණයට, විනිශ්චය සභාවට හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරියට බලය තිබිය යුතු අතර, එම තැනැත්තා එම කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයට යටත්ව සිටින ලද කාලසීමාව, එකී නියම කරන ලද කාලසීමාව ගණනය කිරීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලබා දෙන ලද යම් සහනයක්,-

(අ) පහත සඳහන් රීති අදාළ වන්නා වූ-

(i) 2020 මැයි මස 6 වන දිනැති අංක 2174/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2020 ශ්‍රේෂ්ඨාධිකරණ (තාවකාලික විධිවිධාන) රීති;

(ii) 2021 ජනවාරි මස 21 වන දිනැති අංක 2211/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (තාවකාලික විධිවිධාන) රීති;

(iii) 2020 මැයි මස 12 වන දිනැති අංක 2175/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) රීති; හෝ

(iv) 2021 ජනවාරි මස 21 වන දිනැති අංක 2211/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති;

(ආ) යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයකට අදාළව වූ සහනයක් වශයෙන් යම් කාලසීමාවක් බැහැර කිරීමක් ලබා දෙන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක් හෝ අභියාචනාධිකරණ රීතියක් අදාළ වන්නා වූ,

යම් ඉල්ලීමක් හෝ අභියාචනයක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

## II වන කොටස

### විකල්ප අධිකරණ නම් කිරීම

කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් මඟින් බලපෑමට ලක් වූ අධිකරණ වෙනුවට විකල්ප අධිකරණ නම් කිරීම

3. (1) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 46 වන සහ 47 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන් යම් මුල් අවස්ථා අධිකරණයක කටයුතු සාමාන්‍ය පරිදි සිදු කරගෙන යාමට බාධාවක් සිදුවන අවස්ථාවක දී, එම කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වය පවත්නා කාලසීමාව සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින්, එම අධිකරණය වෙනුවට වූ විකල්ප අධිකරණය වශයෙන් සමගාමී

අධිකරණ බලයක් සහිත ආසන්නත ම අධිකරණය නම් කරනු ලැබිය හැකි ය. එම මුල් අවස්ථා අධිකරණයේ ගොනු කරන ලද හෝ එම මුල් අවස්ථා අධිකරණය මඟින් සලකා බලන ලද යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් හෝ ගොනු කරන ලද යම් අලුත් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්, එසේ නම් කරන ලද අධිකරණය මඟින් සලකා බැලීම හෝ විභාග කිරීම සිදු කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද, මේ උපවගන්තියේ සඳහන් කරන ලද නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්-

(අ) එවැනි යම් මුල් අවස්ථා අධිකරණයක් මඟින් එම නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය, තීන්දුවක්, ආඥාවක් හෝ වෙනත් ප්‍රකාශ කිරීමක් සඳහා වෙන් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ආ) එම නඩුවේ, අපරාධ නඩුවේ, නඩු කටයුත්තේ හෝ කාරණයේ සියලු විභාග කිරීම් එම මුල් අවස්ථා අධිකරණය ඉදිරියේ දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී,

මාරු කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද විකල්ප අධිකරණයක ගොනු කරන ලද හෝ විකල්ප අධිකරණයක් විසින් සලකා බලන ලද යම් නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් පසුව, එම නඩුවට අදාළව කලින් අධිකරණ බලය ක්‍රියාත්මක කරන ලද මුල් අවස්ථා අධිකරණයේ සාමාන්‍ය කටයුතු නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව එම මුල් අධිකරණය වෙත මාරු කරනු ලැබිය හැකි යඃ

එසේ වුවද, මේ උපවගන්තියේ සඳහන් කරන ලද නඩුවක්, අපරාධ නඩුවක්, නඩු කටයුත්තක් හෝ කාරණයක්-

(අ) විකල්ප අධිකරණය විසින් නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය, තීන්දුවක්, ආඥාවක් හෝ වෙනත් ප්‍රකාශ කිරීමක් සඳහා වෙන් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ආ) එම නඩුවේ, අපරාධ නඩුවේ, නඩු කටයුත්තේ හෝ කාරණයේ සියලු විභාග කිරීම් එම මුල් අවස්ථා අධිකරණය ඉදිරියේ දී සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී,

මාරු කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

III වන කොටස

**දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම**

දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම

**4.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මුල් අවස්ථා අධිකරණයක් ඉදිරියේ වන යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක දී, කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන්-

(අ) යම් තැනැත්තකුට අධිකරණයේ පෙනී සිටීමට නොහැකි වන අවස්ථාවක දී; හෝ

(ආ) සාමාන්‍ය ක්‍රියා පටිපාටිය යටතේ අධිකරණයේ කටයුතු සිදු කරගෙන යාමට නොහැකි වන අවස්ථාවක දී,

එම අධිකරණයේ පවතින එම නඩුව, ඉල්ලීම, අභියාචනය හෝ නඩු කටයුත්ත, අග්‍රවිනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි පරිදි වන යම් කොන්දේසිවලට යටත්ව, දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් නිර්මාණය කරනු ලබන සජීවී වීඩියෝ හෝ සජීවී රූපවාහිනී සබැඳියක් මඟින් සිදු කරනු ලැබිය හැකි ය.

IV වන කොටස

**ගිවිසුම් සම්බන්ධයෙන් වන තාවකාලික සහනය**

උපලේඛනගත ගිවිසුම්

**5.** මේ කොටසේ කාර්යය සඳහා, "උපලේඛනගත ගිවිසුම" යන්නෙන්, මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිවිසුමක් හෝ කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි වන වෙනත් යම් ගිවිසුමක් අදහස් වේ.

ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට හෝ ගිවිසුම්ගත අයිතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් වන සහනය

**6.** (1) වෙනත් යම් ලිඛිත නීතියක, ගිවිසුමක හෝ එකඟතා ගිවිසුමක කුමක් සඳහන් වුව ද, උපලේඛනගත ගිවිසුමක යම් පාර්ශ්වයක්-

(අ) යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයකට යටත්ව සිටින අවස්ථාවක දී; සහ

(ආ) එම කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වය හේතුවෙන් එම ගිවිසුම යටතේ වන යම් වගකීමක් ඉටු කිරීමට හෝ යම් අයිතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අවස්ථාවක දී,

එම පාර්ශ්වය විසින්, අදාළ විය හැකි යම් නීතියක් යටතේ එම ගිවිසුම සම්බන්ධයෙන් විනිශ්චයක් කිරීමට අනන්‍යාකාරයකින් අධිකරණ බලය, අධිකාරී බලය හෝ බලය සහිත අධිකරණය, විනිශ්චය සභාව හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරිය වෙත, මේ පනතේ මේ කොටස යටතේ වූ සහනයක් සඳහා වන ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, එම අධිකරණය, විනිශ්චය සභාව හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරිය විසින්, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, උපලේඛනගත ගිවිසුම යටතේ එම වගකීම හෝ අයිතිය ඉටු කරනු ලැබීමට හෝ ක්‍රියාත්මක කරනු ලැබීමට අනන්‍යාකාරයකින් නියම කරන ලද කාලසීමාවෙන්, එම පාර්ශ්වය විසින් වගකීම ඉටු කිරීමෙන් හෝ අයිතිය ක්‍රියාත්මක කිරීමෙන් වළක්වනු ලැබූ කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයට ඔවුන් යටත්ව සිටි කාලසීමාව බැහැර කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන පාර්ශ්වය වෙත ගිවිසුමේ අනෙක් පාර්ශ්වය හෝ පාර්ශ්වයන් විසින් ස්වෙච්ඡාවෙන් ම හෝ ගිවිසුමේ කොන්දේසි අනුව සහනයක් වශයෙන් කාලය බැහැර කිරීමක් ලබා දී ඇති අවස්ථාවක දී, අධිකරණය, විනිශ්චය සභාව හෝ යම් නීතියක් මඟින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් අධිකාරිය විසින් යුක්ති සහගත සහ සාධාරණ වන බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව මේ වගන්තිය යටතේ වැඩිදුර සහනයක් ලබා දිය හැකි ය.

(3) මේ පනතේ මේ කොටස යටතේ වූ සහනයක් සඳහා වූ ඉල්ලීමක්, 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඉල්ලීම

ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් ලබා දී ඇති යම් ණය සහන කාලයක් හෝ කාලය දීර්ඝ කිරීමක් හෙළි කරනු ලබන යම් ලේඛන ද ඇතුළුව එම ඉල්ලීම තහවුරු කරන අදාළ ලේඛන ද සහිතව විය යුතු ය.

6 වන වගන්තිය යටතේ වන ඉල්ලීමක් මඟින් නඩු පැවරීමේ අයිතිය වළක්වනු නොලැබිය යුතු බව

7. (1) යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයකට යටත්ව සිටින සහ එම කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වය හේතුවෙන් උපලේඛනගත ගිවිසුමක් යටතේ වූ යම් වගකීමක් ඉටු කිරීමට හෝ යම් අයිතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වන එම උපලේඛනගත ගිවිසුමේ යම් පාර්ශ්වයක් විසින් 6 වන වගන්තිය යටතේ සිදු කරනු ලබන ඉල්ලීමක් මඟින්, එම ගිවිසුමේ වෙනත් යම් පාර්ශ්වයක් විසින් එම නොහැකි වීමට අදාළව (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නඩුවක් පැවරීමෙන් වළක්වනු නොලැබිය යුතු යෟ

එසේ වුව ද, එම නොහැකි වීම කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන් සිදු වූ බවට වන කරුණ, එම නඩුවේ එම වගකීම ඉටු කිරීමට හෝ එම අයිතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ පාර්ශ්වය සඳහා වූ විත්තිවාචකයක් වශයෙන් පැවතිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද නඩුවලට-

(අ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වයට හෝ එම පාර්ශ්වයේ ඇපකරුවකුට හෝ ඇප බැඳුම්කරුවකුට එරෙහිව අධිකරණයක පවතින නඩුවක්;

(ආ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වයට හෝ එම පාර්ශ්වයේ ඇපකරුවකුට හෝ ඇප බැඳුම්කරුවකුට එරෙහිව 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත යටතේ වන නඩු කටයුතු;

(ඇ) යම් නිශ්චල දේපළක් මත වන යම් ඇපයක් බලාත්මක කිරීම සඳහා වන නඩුවක්;

(ඈ) වෙළඳාමක, ව්‍යාපාරයක හෝ වෘත්තියක කාර්යයක් සඳහා භාවිත කරන ලද යම් චංචල දේපළක් මත වූ යම් ඇපයක් බලාත්මක කිරීම සඳහා වන නඩුවක්;

(ඉ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වය හෝ එම පාර්ශ්වයේ ඇපකරුවකු හෝ ඇප බැඳුම්කරුවකු

සම්බන්ධයෙන් සමථයකට එළඹීමක් හෝ වැඩපිළිවෙළක් අනුමත කිරීම පිණිස ණය හිමියන්ගේ රැස්වීමක් කැඳවීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ වන ඉල්ලීමක්;

(ඊ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට අපොහොසත් වන පාර්ශ්වය හෝ එම පාර්ශ්වයේ ඇපකරු හෝ ඇප බැඳුම්කරු සම්බන්ධයෙන් අධිකරණමය කළමනාකරණ නියමයක් සඳහා වන ඉල්ලීමක්;

(උ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වය හෝ එම පාර්ශ්වයේ ඇපකරු හෝ ඇප බැඳුම්කරු ගණන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීමක්;

(ඌ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වය හෝ එම පාර්ශ්වයේ ඇපකරු හෝ ඇප බැඳුම්කරු සම්බන්ධයෙන් වන වස්තුභංගත්වය පිළිබඳ වන ඉල්ලීමක්;

(එ) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වය හෝ එම පාර්ශ්වයේ ඇපකරු හෝ ඇප බැඳුම්කරු සම්බන්ධයෙන් වන යම් වගකීම් දැරීමකට අදාළව භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු පත් කිරීම සඳහා වන ඉල්ලීමක්;

(ඒ) අධිකරණයේ අවසරය සහිතව හැර, ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වය හෝ එම පාර්ශ්වයේ ඇපකරු හෝ ඇප බැඳුම්කරු සම්බන්ධයෙන් වන යම් දේපළකට එරෙහිව වන ඇස්කිසි කිරීමක්, දේපළ තහනමක් හෝ වෙනත් නෛතික ක්‍රියාවලියක් ආරම්භ කිරීමට හෝ අයකර ගැනීමට වන නඩුවක්;

(ඔ) යම් චංචල දේපළ කල්බදු ගිවිසුමක්, කුලී සින්නක්කර ගිවිසුමක් හෝ හිමිකාරත්වය රඳවා තබාගැනීමේ ගිවිසුමක් යටතේ වෙළඳාමක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක කාර්යය සඳහා භාවිත කරන ලද භාණ්ඩ වන යම් භාණ්ඩවල අයිතිය නැවත ලබා ගැනීම සඳහා වන නඩුවක්;

(ඕ) ඉටු කිරීමට නොහැකි වන වගකීම කුලිය හෝ වෙනත් මුදල් නොගෙවීම වන අවස්ථාවක දී, නිශ්චල දේපළ බදු දීමක් හෝ බලපත්‍රයක් මත ලබා දීමක් වන උපලේඛනගත ගිවිසුමක් අවසන් කිරීම සඳහා වන නඩුවක්;

(ක) නිශ්චල දේපළ බදු දීමක් හෝ බලපත්‍රයක් මත ලබා දීමක් වන උපලේඛනගත ගිවිසුමක් යටතේ නැවත ඇතුළු වීමේ හෝ නැවත සතුකර ගැනීමේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඒ හා සමාන ප්‍රතිඵලයක් සහිත වෙනත් යම් අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වන නඩුවක්;

(ග) ගිවිසුම්ගත වගකීම ඉටු කිරීමට නොහැකි වන පාර්ශ්වයට හෝ එම පාර්ශ්වයේ ඇපකරුවකුට හෝ ඇප බැඳුම්කරුවකුට එරෙහිව අධිකරණයක තීන්දුවක් හෝ 1995 අංක 11 දරන බේරුම් කිරීමේ පනත යටතේ පවත්වන ලද බේරුම් කිරීමේ නීති කෘත්‍යයක් මඟින් ලබාදෙන ලද තීරණයක් බලාත්මක කරගැනීම සඳහා වන නඩුවක්;

(ච) අයිතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වන පාර්ශ්වයට ගෙවන ලද යම් ප්‍රතිශ්‍රාවක යම් කොටසක් නැවත සතු කර ගැනීම; හෝ

(ජ) නියම කරනු ලැබිය හැකි පරිදි වන වෙනත් යම් නඩුවක්,

ඇතුළත් විය යුතු ය.

සැක දුරු කිරීම

**8.** සැක දුරු කිරීම සඳහා, උපලේඛනගත ගිවිසුමක පාර්ශ්වයක් විසින් ඒ ගිවිසුම යටතේ අන්‍යාකාරයෙන් ඉටු කළ යුතු බවට හෝ ක්‍රියාත්මක කළ යුතු බවට නියම කරනු ලැබ ඇති යම් වගකීමක් ඉටු කිරීමෙන් හෝ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමෙන් ඒ පාර්ශ්වය යම් ආකාරයකින් නිදහස් කිරීමක් ලෙස, මේ පනතේ මේ කොටසේ විධිවිධාන තේරුම් ගනු නොලැබිය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

## V වන කොටස

## සාමාන්‍ය

මේ පනත යටතේ වන සහනය මත වන සීමා

**9.** (1) මේ පනතේ 2 වන වගන්තිය හෝ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සහනයක් ලෙස බැහැර කරන ලද යම් කාලසීමාවක් මාස දොළහක කාලසීමාවක් ඉක්මවනු නොලැබිය යුතු ය:

එසේ වුව ද, එසේ සිදු කිරීම සාධාරණ සහ යුක්තිසහගත බවට අධිකරණය, විනිශ්චය සභාව හෝ යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් යම් අධිකාරියක් සෑහීමට පත්වන අවස්ථාවක දී, මාස දොළහක් ඉක්මවන කාලසීමාවක් සහනයක් ලෙස බැහැර කරනු ලැබිය හැකි අතර, එසේ බැහැර කරන ලද කාලසීමාව වැඩිදුර මාස හයක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය:

එසේම තවදුරටත්, සහනයක් වශයෙන් බැහැර කරන ලද කාල සීමාව සමස්තයක් වශයෙන් ගත් විට මාස දහඅටක් නොඉක්මවිය යුතු ය.

(2) 2020 මාර්තු මස 1 වන දින හෝ ඉන්පසුව 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) හේතුවෙන් පැන නගින අවස්ථානුගත කරුණුවලට අදාළව සහනයක් ලෙස මහ බැංකුව හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් විසින් යම් ණය සහන කාලයක් ලබා දෙනු ලැබ ඇති අවස්ථාවක දී, මේ පනතේ IV වන කොටස යටතේ ලබා දෙනු ලබන යම් සහනයක් අදාළ නොවිය යුතු ය.

ඔප්පු කිරීමේ භාරය

10. (අ) 2 වන වගන්තියේ කාර්යය සඳහා නියම කරන ලද කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වීම; හෝ

(ආ) 6 වන හෝ 7 වන වගන්තියේ කාර්යය සඳහා යම් ගිවිසුම්ගත වගකීමක් ඉටු කිරීමට හෝ යම් ගිවිසුම්ගත අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම,

යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් හේතුවෙන් සිදු වූ බව ඔප්පු කිරීමේ භාරය ඒ වගන්ති යටතේ, අවස්ථාවෝචිත පරිදි, සහනය සඳහා ඉල්ලීමක් කරනු ලබන හෝ නිදහසට කරුණු දක්වන පාර්ශ්වය කෙරෙහි විය යුතු ය.

නියෝග

11. (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ මේ පනත යටතේ නියෝග සාදනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සාදනු ලැබීමට බලය දෙනු ලැබ ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝගය පළ කරන ලද දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක්

ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය

**12.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"මහ බැංකුව" යන්නෙන් (420 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"කොවිඩ් - 19'' යන්නෙන් (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ 2020 මාර්තු මස 20 වන දින අංක 2167/18 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මඟින් නිරෝධායනීය රෝගයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) අදහස් වේ;

"කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වය" යන්නට-

(අ) කොවිඩ් - 19;

(ආ) 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) හේතුවෙන් හෝ ඊට සම්බන්ධව සාදනු ලබන යම් නීතියක්, නියමයක් හෝ විධානයක් වන ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක හෝ දේශයක යම් නීතියක් හෝ රජයේ හෝ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් රටක හෝ දේශයක රජයේ හෝ වෙනත් රාජ්‍ය අධිකාරියක නියමයක් හෝ විධානයක් ක්‍රියාත්මක වීම හෝ ඊට අනුකූල වීම; හෝ

(ඇ) (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් තත්ත්වයන්ගෙන් පැනනගින හෝ ඊට ආනුෂංගික වෙනත් යම් තත්ත්වයක්,

ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ මේ පනත පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"නියම කිරීම" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"නියාමන අධිකාරිය" යන්නෙන්, උපලේඛනගත ගිවිසුමක් සම්බන්ධයෙන් නියාමන හෝ අනුමත කිරීමේ අධිකාරියක් වශයෙන් යම් ලිඛිත නීතියක් මඟින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද අධිකාරියක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පළමුවන උපලේඛනය (5 වන වගන්තිය)

**උපලේඛනගත ගිවිසුම්**

1. (අ) ශ්‍රී ලංකාවේ පිහිටි යම් වාණිජ හෝ කාර්මික නිශ්චල දේපළක් මත සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ණය පහසුකමක් සුරක්ෂිත වන අවස්ථාවක දී, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් විසින් හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලත් මුදල් සමාගමක් විසින් ව්‍යවසායකට ණය පහසුකමක් ප්‍රදානය කිරීම සඳහා වන ගිවිසුමක්;

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටි යම් පිරියත, යන්ත්‍රෝපකරණයක් හෝ ස්ථාවර වත්කමක් මත සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ණය පහසුකමක් සුරක්ෂිත වන අවස්ථාවක දී; සහ

(ii) ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ ස්ථාවර වත්කම අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදනය, සැදීම හෝ වෙනත් ව්‍යාපාරික කාර්ය සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී,

1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් විසින් හෝ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලත් මුදල් සමාගමක් විසින් ව්‍යවසායකට ණය පහසුකමක් ප්‍රදානය කිරීම සඳහා වන ගිවිසුමක්;

(ඈ) ඉදිකිරීම් ගිවිසුමක් හෝ සැපයුම් ගිවිසුමක් අනුව ප්‍රදානය කරන ලද කාර්යසාධන බැඳුම්කරයක් හෝ ඊට සමාන බැඳුම්කරයක්;

(ඇ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට දෙනු ලැබූ හෝ කොන්දේසි මත විකුණනු ලැබූ භාණ්ඩය-

(i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති යම් පිරියත, යන්ත්‍රෝපකරණයක් හෝ ස්ථාවර වත්කමක් වන විට ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ ස්ථාවර වත්කම නිෂ්පාදනය, සෑදීම හෝ වෙනත් ව්‍යාපාරික කාර්ය සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ii) වාණිජ රථයක් වන අවස්ථාවක දී,

1982 අංක 29 දරන පාරිභෝගික ණය පනතේ අර්ථානුකූලව වන කුලී සින්නක්කර ගිවිසුමක්;

(ඉ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති යම් පිරියත, යන්ත්‍රෝපකරණයක් හෝ ස්ථාවර වත්කමක් නිෂ්පාදනය, සෑදීම හෝ වෙනත් ව්‍යාපාරික කාර්ය සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී, ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ ස්ථාවර වත්කමෙහි; හෝ

(ii) වාණිජ රථයක,

කල් බද්දක්;

(ඊ) කල්බදු මූල්‍යකරණය යටතේ සපයන ලද උපකරණය-

(i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති යම් පිරියත, යන්ත්‍රෝපකරණයක් හෝ ස්ථාවර වත්කමක් වන විට ඒ පිරියත, යන්ත්‍රෝපකරණය හෝ ස්ථාවර වත්කම නිෂ්පාදනය, සෑදීම හෝ වෙනත් ව්‍යාපාරික කාර්ය සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී; හෝ

(ii) වාණිජ රථයක් වන අවස්ථාවක දී,

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ අර්ථානුකූලව වූ ඒ කල්බදු මූල්‍යකරණයක්;

(උ) අවස්ථාවක් හා සම්බන්ධ ගිවිසුමක්;

(ඌ) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ගිවිසුමක්;

(එ) ඉදිකිරීම් ගිවිසුමක් හෝ සැපයුම් ගිවිසුමක්;

(ඒ) නේවාසික නොවන නිශ්චල දේපළක කල් බද්දක්;

(ඔ) නිවාස නවාතැන් ඒකක එකක් හෝ ඊට වැඩි ගණනක් මිලදී ගැනීමට අපේක්ෂා කරන ගැනුම්කරුවකුට නිවාස සංවර්ධකයකු විසින් දෙන ලද වරණයක්;

(ඕ) නිවාස නවාතැන් ඒකක එකක් හෝ ඊට වැඩි ගණනක් විකිණීම සහ මිලදී ගැනීම සඳහා නිවාස සංවර්ධකයකු හා ගැනුම්කරුවකු අතර වන ගිවිසුමක්;

(ක) වාණිජ දේපළ ඒකක එකක් හෝ ඊට වැඩි ගණනක් මිලදී ගැනීමට අපේක්ෂා කරන ගැනුම්කරුවකුට වාණිජ දේපළ සංවර්ධකයකු විසින් දෙන ලද වරණයක්;

(ග) වාණිජ දේපළ ඒකක එකක් හෝ ඊට වැඩි ගණනක් විකිණීම සහ මිලදී ගැනීම සඳහා වාණිජ දේපළ සංවර්ධකයකු හා ගැනුම්කරුවකු අතර වන ගිවිසුමක්,

උපලේඛනගත ගිවිසුම්වලට ඇතුළත් වන්නේ ය.

2. මේ උපලේඛනයේ කාර්යය සඳහා -

"වාණිජ දේපළ සංවර්ධකයා" යන්නෙන්, වාණිජ දේපළ සංවර්ධන ව්‍යාපාරයේ නිරත වන යම් තැනැත්තකු අදහස් වේ;

"වාණිජ දේපළ සංවර්ධනය" යන්නෙන්, යම් වාණිජ දේපළක් ඉදිකිරීමේ කාර්යය සඳහා ඉඩම තුළ, ඉඩම මත, ඉඩමට ඉහළින් හෝ ඉඩම යට යම් ගොඩනැගිලි මෙහෙයුම් ඇතුළුව වාණිජ දේපළ ඒකක යම් ප්‍රමාණයක් ඉදි කිරීම හෝ ඉදි කිරීමට කටයුතු සැලැස්වීම සහ ඒ වාණිජ දේපළට අනුබද්ධ ඉඩම විකිණීම අදහස් වේ;

"වාණිජ දේපළ" යන්නෙන්, වාණිජ හෝ කාර්මික අරමුණක් සඳහා හෝ අරමුණු කීපයක් අතුරින් ප්‍රමුඛතම අරමුණ ලෙස වාණිජ හෝ කාර්මික අරමුණක් සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ අවසර දෙනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ වෙනත් පරිශ්‍රයක් අදහස් වේ;

"වාණිජ රථය" යන්නෙන්, වාණිජ හෝ කාර්මික අරමුණක් සඳහා යොදා ගනු ලබන යම් මෝටර් වාහනයක් අදහස් වේ;

"ඉදිකිරීම් ගිවිසුම" යන්නෙන්, පහත සඳහන් කරුණුවලින් යම් කරුණක් සඳහා යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් සමඟ එළඹෙන ගිවිසුමක් අදහස් වේ:-

(අ) ඉදිකිරීම් කටයුතු සිදු කිරීම;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ ආස්ථිත්‍යය වෙනුවෙන් උප කොන්ත්‍රාත්තුවක් යටතේ හෝ අන්‍යාකාරයෙන් වෙනත් අය මඟින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා කටයුතු සැලැස්වීම;

(ඇ) ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා ඒ තැනැත්තාගේ ශ්‍රමය හෝ ආස්ථිත්‍යයට අයත් ශ්‍රමය හෝ වෙනත් අයගේ ශ්‍රමය ලබාදීම;

"අවස්ථාවක් හා සම්බන්ධ ගිවිසුම" යන්නෙන්-

(අ) ව්‍යාපාර රැස්වීමක්, දිරිගැන්වීමේ චාරිකාවක්, සම්මන්ත්‍රණයක්, ප්‍රදර්ශනයක්, විකුණුම් අවස්ථාවක්, ප්‍රසංගයක්, සංදර්ශනයක්, විවාහ මංගල උත්සවයක්, සාදයක් හෝ වෙනත් සමාජ ඒකරාශීවීමක් හෝ ක්‍රීඩා කටයුත්තක්; හෝ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කුමන හෝ අවස්ථාවකට සහභාගිවන්නන්, පැමිණෙන්නන්, අමුත්තන්, අනුශාසකයන් හෝ ප්‍රේක්ෂකයන්,

සඳහා ස්ථානයක්, නවාතැනක්, පහසුකම්, ප්‍රවාහනය, විනෝදාස්වාදය, ආහාරපාන සැපයීම හෝ වෙනත් භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන ගිවිසුමක් අදහස් වේ;

"නිවාස නවාතැන" යන්නට, මිනිස් වාසස්ථානය සඳහා හෝ මිනිස් වාසස්ථානය සඳහා සහ ව්‍යාපාර පරිශ්‍රයක් ලෙස සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ම ඉදිකරන ලද, යොදා ගන්නා ලද හෝ අදහස් කරන ලද ගොඩනැගිල්ලක් හෝ නිවාස පෙළක් ඇතුළත් වේ;

"නිවාස සංවර්ධකයා" යන්නෙන්, නිවාස සංවර්ධන ව්‍යාපාරයක නිරත වන යම් තැනැත්තකු අදහස් වේ;

"නිවාස සංවර්ධනය" යන්නෙන්, යම් නිවාස නවාතැනක් ඉදිකිරීමේ කාර්යය සඳහා ඉඩම තුළ, ඉඩම මත, ඉඩමට ඉහළින් හෝ ඉඩම යට යම් ගොඩනැගිලි මෙහෙයුම් ඇතුළු නිවාස නවාතැන් ඒකක යම් ප්‍රමාණයක් ඉදිකිරීම හෝ ඉදි කිරීමට කටයුතු සැලැස්වීම සහ ඒ නිවාස නවාතැනට අනුබද්ධ ඉඩම විකිණීම අදහස් වේ;

"සැපයුම් ගිවිසුම" යන්නෙන්, එක් පාර්ශ්වයක් විසින් ඉදිකිරීම් කටයුතුවල කාර්යය සඳහා අවශ්‍ය වන භාණ්ඩ, ඉදිකිරීම් කටයුතු සිදු කරන හෝ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට කටයුතු සලස්වන ව්‍යාපාරයක නිරත වන වෙනත් යම් පාර්ශ්වයකට සැපයීමට භාර ගනිමින් ඇති කරගනු ලබන ගිවිසුමක් අදහස් වේ;

"සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ගිවිසුම" යන්නෙන්-

(අ) මුහුදෙන් හෝ ගොඩබිමෙන් මඟින් ජාත්‍යන්තරව ප්‍රවාහනය කිරීම සඳහා වන ගිවිසුමක්;

(ආ) ශ්‍රී ලංකාවට පැමිණෙන අමුත්තන්, දේශීය සංචාරකයන් හෝ පිටතට යන සංචාරකයන් සඳහා ප්‍රවාහනය, කෙටි කාලීන නවාතැන්, විනෝදාස්වාදය, භෝජනාගාර, ආහාර පාන, චාරිකා හෝ වෙනත් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා වන ගිවිසුමක්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ සංචාරක කර්මාන්තයට අදාළ නිෂ්පාදන වෙළඳාමේ හෝ සිල්ලර වෙළඳාමේ කාර්ය සඳහා බෙදාහැරීම සඳහා වන ගිවිසුමක්,

අදහස් වේ;

"ඒකකය" යන්නෙන්, මට්ටම් එකක් නැතහොත් ඊට වැඩි ගණනක් මත පිහිටියා වූ ද, සහ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව, නේවාසික, වාණිජ හෝ කාර්මික අරමුණක් සඳහා සම්පූර්ණ සහ වෙන් වූ ඒකකයක් ලෙස භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන්නා වූ ද යම් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිල්ලක කොටසක තිරස් ස්තරය අදහස් වේ.